සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## පුරවැසි අධ්‍යාපනය I

| | | | |
|---|---|---|---|
| (1) 2 | (11) 3 | (21) 4 | (31) 1 |
| (2) 1 | (12) 4 | (22) 3 | (32) 4 |
| (3) 4 | (13) 2 | (23) 3 | (33) 2 |
| (4) 3 | (14) 4 | (24) 2 | (34) 3 |
| (5) 2 | (15) 2 | (25) 3 | (35) 1 |
| (6) 1 | (16) 4 | (26) 3 | (36) 2 |
| (7) 3 | (17) 2 | (27) 1 | (37) 1 |
| (8) 1 | (18) 3 | (28) 1 | (38) 1 |
| (9) 3 | (19) 2 | (29) 4 | (39) 4 |
| (10) 2 | (20) 2 | (30) 3 | (40) 4 |

(ලකුණු 1x40=40)

## පුරවැසි අධ්‍යාපනය II

(01) (i)
- ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
- අත්තනෝමතික පාලනයක් බිහිවීම වැළැක්වීම
- ආණ්ඩු පක්ෂයේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමට අවස්ථාව සැලසීම

(ලක්ෂණ දෙකක් දැක්වීමට ලකුණු 02)

(ii)
- රාජ්‍ය සේවය පාලනය
- රාජ්‍ය ආරක්ෂක කාර්යයන්
- රාජ්‍ය මූල්‍ය පාලනය
- නියෝග හා ආඥා පැනවීම

(කාර්යයන් දෙකක් සඳහා ලකුණු 02)

(iii)
- ඇමෙරිකා එක්සත් ජනපදය
- ස්විට්සර්ලන්තය
- ඕස්ට්‍රේලියාව

(රටවල් දෙකක් නම් කිරීමට ලකුණු 02)

(iv)
- මඩකලපුව
- අම්පාර
- ත්‍රිකුණාමලය

(දිස්ත්‍රික්ක දෙකක් නම් කිරීමට ලකුණු 02)

(v)
- නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම
- නියමිත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ට ඡන්ද දායකත්වය / ඡන්ද අපේක්ෂකත්වය ලැබීමේ අයිතිය තහවුරු වී තිබීම
- මැතිවරණ නීතිරීතිවලට අනුකූලව මැතිවරණ පැවැත්වීම

(ලක්ෂණ දෙකක් දැක්වීමට ලකුණු 02)

(vi) - ක්‍රි.ව. 1215 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව. 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ක්‍රි.ව. 1917 - රුසියානු විප්ලවය (වැදගත් අවස්ථා දෙකක් දැක්වීම ලකුණු 02)

(vii) - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (දෙකක් නම් කිරීම සඳහා ලකුණු 02)

(viii) - ගෝලීය උණුසුම් වීම
- ඕසෝන් ස්ථරයට හානිවීම
- අම්ල වැසි ඇතිවීම (අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහා ලකුණු 02)

(ix) - අවිචාරවත් අවස්ථාව
- බෙදීම් අවස්ථාව (අවස්ථා දෙකක් සඳහා ලකුණු 02)

(x) - සප්ත
- සෆ්ප්තා (ගිවිසුම් දෙකක් සඳහා ලකුණු 02) (ලකුණු 2x10=20)

(02) (i) 1. සරල බහුතර නියෝජන ක්‍රමය
2. සමානුපාතික නියෝජන ක්‍රමය (ලකුණු 02)

(ii) (i) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව
(ii) (i) භූමිය (ii) ජනගහනය (ලකුණු 03)

(iii)
- ජනවර්ග, ආගම, භාෂාව, කුලය වැනි භේද නොසලකා සියල්ලන්ගේ මතය නියෝජනය වන පරිදි නියෝජිතයන් තෝරා පත්කර ගැනීමට අවස්ථාව ලැබීම
- දේශපාලන ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට අවශ්‍ය වන නායකයන් ප්‍රාදේශීය මට්ටමෙන් බිහිකර ගැනීමට අවස්ථාව ලැබීම
- ඡන්ද කොට්ඨාසයට වග කියන නියෝජිතයකු තෝරා පත් කර ගැනීමට ජනතාවට අවස්ථාව ලැබීම
- ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩප්‍රස්තා සැලසීම
(ප්‍රයෝජන 3ට ලකුණු 03 යි විස්තර කිරීමට ලකුණු 02යි = ලකුණු 05 යි)

(03) (i)
- ඇමරිකා එක්සත් ජනපදය
- ඕස්ට්‍රේලියාව
- සිංගප්පූරුව
- දකුණු කොරියාව

(රටවල් දෙකක් නම් කිරීමට ලකුණු 02යි)

(ii)
- රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලිකරණය කිරීම
- වෙළෙඳපොළ තත්ත්වය මත මිල තීරණය වීමට ඉඩ සැලසීම
- දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජනයන් දිරි ගැන්වීම
- සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම (ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 03)

(iii)
- දක්ෂිණ අධිවේගී මාර්ගය
- කොළඹ දකුණ වරාය ව්‍යාපෘතිය
- ඔලුවිල් වරාය ව්‍යාපෘතිය
- උමා ඔය සංවර්ධන ව්‍යාපාතිය
- මොරගහ කන්ද ජලාශ ව්‍යාපෘතිය
- මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ

(ව්‍යාපෘති තුන නම් කිරීමට ලකුණු 03 යි. ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02යි = ලකුණු 05 යි)

(04) (i) ◆ ආගමික වතාවත් කෙරෙහි යොමුවීම
◆ මනෝ විද්‍යාත්මක අභ්‍යාස මගින්
◆ උපදේශන මගින්
◆ ස්වභාවික පරිසරය නිරීක්ෂණය මගින්

(අංශ දෙකක් නම් කිරීමට ලකුණු 02)

(ii) A - චර්යාව
B - සන්දර්භය
C - ආකල්ප (සංකල්ප තුන නම් කිරීමට ලකුණු 03 යි)

(iii) ◆ සාකච්ඡා ක්‍රමය
◆ සහමන්ත්‍රණය හා කේවල් කිරීම
◆ මැදිහත්කරණය
◆ සමථකරණය
◆ බේරුම් කිරීම
◆ විනිසීමේ ක්‍රියාවලිය

(ක්‍රමවේද තුනට ලකුණු 03යි. ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02යි. ලකුණු 05යි)

(05) (i) ◆ අධිකාරී බලය පදනම් කරගෙන රාජ්‍ය විසින්ම පනවන්නක් වීම
◆ මිනිස් ක්‍රියාකාරකම් හා චර්යාවන් පාලනය කිරීමේ අරමුණින් පනවන්නක් වීම
◆ යුක්ති සහගත හා සාධාරණ විය යුතු වීම
◆ පොදු සමාජ යහපත අරමුණු කොටගෙන පැන විය යුතු වීම

(ගුණාංග දෙකක් දැක්වීමට ලකුණු 02 යි)

(ii) ◆ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
◆ විවිධ අණපනත්
◆ අධිකරණ තීන්දු
◆ නීති විශාරදයන්ගේ මත හා විද්‍යාත්මක සිද්ධාන්ත (මූලාශ්‍ර තුනක් දැක්වීමට ලකුණු 03 යි)

(iii) ◆ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය
◆ අපරාධ නීතිය - සමාජයක පුද්ගලයෙකු හෝ යම් කණ්ඩායමක් විසින් එම සමාජයට විරුද්ධව කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බලපාන නීති
◆ සිවිල් නීතිය - සමාජයක පුද්ගලයන්ගේ පුද්ගලික සම්බන්ධතා පාලනය කරන සහ ඔවුන් අතර ඇති වැරදි සම්බන්ධයෙන් බලපාන නීතිය

(නීතියේ කොටස් 3ට ලකුණු 03 යි ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02යි = ලකුණු 05)

(06) (i) ◆ ළමයාගේ උපරිම යහපත
◆ සහභාගිත්වය
◆ පැවැත්ම සහ සංවර්ධනය
◆ වෙනස් කොට නොසැලකීම (මේවායින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 02 යි)

(ii) ◆ ප්‍රකාශනයේ නිදහස

◆ චින්තනයේ, හෘදය සාක්ෂියේ හා ආගමික විශ්වාසයේ නිදහස

◆ යහපත් ජීවන තත්ත්වයක් ලබාගැනීමට ඇති අයිතිය

◆ සෞඛ්‍ය පහසුකම් හා පෝෂණය ලැබීමේ අයිතිය

(අයිතිවාසිකම් තුනක් සඳහන් කිරීමට ලකුණු 03 යි)

(iii) ◆ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම

◆ ශ්‍රී ලංකාවේ නීති සම්පාදනය කරන විට ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැලකිල්ලට ගෙන නීති සම්පාදනය කිරීම

◆ ළමයින් සම්බන්ධ ක්‍රියා කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම සහ බලය පැවරීම

◆ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

(ක්‍රියාමර්ග තුනට ලකුණු 03යි. ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02යි. මුළු ලකුණු 05යි.)

(07) (i) ◆ තම රාජ්‍යයට තනිව සපුරාගත නොහැකි යම් දෙයක් වේ නම් ඒවා සපුරා ගැනීම

◆ දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය ක්ෂේත්‍ර ඔස්සේ සබඳතා පුළුල් කරගත හැකිවීම

◆ ප්‍රබල රාජ්‍යවලින් ඇති කරන බලපෑම්වලින් ආරක්ෂා වීම සඳහා

◆ ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති වන බාධා මඟ හරවා ගැනීම සඳහා

(අරමුණු දෙකක් සඳහා ලකුණු 02 යි)

(ii) ◆ රාජ්‍ය උපාය සම්බන්ධතා

◆ යුද උපාය සම්බන්ධතා

(ආකාර දෙකට ලකුණු 02යි. එකක් විස්තර කිරීමට ලකුණු 01යි. ලකුණු 03යි.)

(iii) ◆ සම්පත් විසංතුලනය හෙවත් එක් එක් රටවල පවතින සම්පත්වල වෙනස් කම්

◆ අවශ්‍යතා සියල්ල තම රට තුළ නිපදවා ගත නොහැකි වීම

◆ අතිරික්ත නිෂ්පාදන අලෙවි කර ගැනීම

◆ ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව

(සාධක 3ට ලකුණු 03 යි ඉන් එකක් විස්තර කිරීමට ලකුණු 02යි = ලකුණු 05)